HAUSFELD

INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

**මාධ්‍ය නිවේදනය**
**2019 අප්‍රේල් 8**

**ශ්‍රී ලංකාවේ හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂට විරුද්ධව ඇමරිකාවේ නඩු පැවරේ**

**ජොහැන්ස්බර්ග්, දකුණු අප්‍රිකාව**

සත්‍යය හා යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතිය (ITJP), හවුස්ෆෙල්ඩ් ජාත්‍යන්තර නීතිඥ ආයතනය හා මානව හිමිකම් නීතිඥ ස්කොට් ගිල්මෝර් සමග එක්ව, වධහිංසාවෙන් දිවි ගලවාගත් රෝයි සමාදනම් වෙනුවෙන්, ශ්‍රී ලංකාවේ හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂට එරෙහිව සිවිල් වන්දි නඩුවක් පවරා තිබේ. එක්සත් ජනපද පුරවැසියකු වන රාජපක්ෂ මහතාට එරෙහිව රෝයි සමාදනම් මෙම පැමිණිල්ල ගොනු කර ඇත්තේ මධ්‍යම කැලිෆෝනියා දිස්ත්‍රික්කයේ එක්සත් ජනපද දිසා අධිකරණයේය. නඩුව පවරන ලද්දේ වධබන්ධනයට ගොදුරු වූවන්ට එක්සත් ජනපදයේ නෛතික සහන සලසන්නාවූ, වධවින්දිතයන් ආරක්ෂා කිරීමේ පනත (Torture Victim Protection Act) යටතේය.

රාජපක්ෂ මහතාට නොතීසි භාර දෙන ලද්දේ ඉරිදු රාත්‍රියේය. ඝාතනය කරන ලද මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග වෙනුවෙන් තවත් සංවිධානයක් විසින් පවරන ලද වෙනම නඩුවක නොතීසි ද ඒ අවස්ථාවේම භාර දෙන ලදී.

ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂට ඒ සමයේ ඍජුවම වාර්තා කළ ශ්‍රී ලංකාවේ පොලිස් ඒකකයක් විසින් බොරු චෝදනා යටතේ කැනඩාවේ පුරවැසියකු වන රෝයි සමාදනම් 2007 සැප්තැම්බරයේ කොළඹදී අත් අඩංගුවට ගන්නා ලදී. සිය බිරිඳ විවාහ කරගනු පිණිස ශ්‍රී ලංකාවට ගොස් සිටියදී තුන් අවුරුද්දක් රඳවාගනු ලැබූ සමාදනම් මහතා නීතිඥ වරයකු හෝ විනිශ්චයකාරවරයකු හමුවට යාමට කරන ලද ඉල්ලීම් දිගටම ප්‍රතික්ෂේප කරන ලදී. රාජපක්ෂ මහතාගේ විධානයට යටත් ආරක්ෂකයෝ සමාදනම් මහතාගේ බිරිඳ දූෂණය කර දරුවා මරා දමන බවට තර්ජනය කළ අතර වෙනත් සිරකරුවන්ට විදුලි සැර වද්දනු ඔහුට බලහත්කාරයෙන් පෙන්නුහ. අඩු අපරාධයකට වරදකරු බව පිළිගැනීමේ ගනුදෙනුවක් මත ඔහු 2010 අගෝස්තුවේදී නිදහස් කරන ලද්දේ ව්‍යාජ පාපොච්චාරණයකට අත්සන් ගැනීමෙන් අනතුරුවය. ගැලවී ආ දිනයේ සිට සමාදනම් මහතා ප්‍රසිද්ධ උද්ඝෝෂකයකු විය. තමන් අත්විඳි ගැහැට පිළිබඳව ඔහු 2011 දී කැනඩා පාර්ලිමේන්තුවේ සාක්ෂි දුන්නේය. 2016 දී ඔහු එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් නඩුවකින් ජයගත් නමුත්, වන්දි ගෙවීමට කරන ලද නියමය ශ්‍රී ලංකාව විසින් පිළිපැද නැත.

“අමානුෂිකත්වය කියන්නේ මොකක්ද කියලා මම තේරුම් ගත්තේ හිරේ ඉන්න කොටයි,” යනුවෙන් පැමිණිලිකාර රෝයි සමාදනම් පැවසීය. “මේතාක් කිසිම වගවීමක් සිදුවී නැහැ. ඒ නිසා යුක්තිය ඉටු කරවා ගැනීම වෙනුවෙන් මම මේ පළමු පියවර ගන්නේ සතුටින්. වධහිංසාවට ගොදුරු වූ ශ්‍රී ලංකාවේ වින්දිතයන්ට මේ ක්‍රියාවෙන් අනාගතය ගැන බලාපොරොත්තුවක් ඇති වේවි.”

“සමාදනම් මහතා දෙමළ කම නිසා හිරගත කොට වධහිංසා කරනු ලැබූ ගිණිය නොහැකි තරම් සාමාන්‍ය වැසියන් අතරින් එක් අයෙක්,” යැයි මානව හිමිකම් නීතිඥ ස්කොට් ගිල්මෝර් පැවසීය. සන්ඩේ ටයිම්ස් මාධ්‍යවේදිනී මාරි කොල්වින්ගේ පවුලේ සාමාජිකයන් විසින් සිරියානු රජයට විරුද්ධව සාර්ථක ලෙස පවරන ලද නඩුව මෙහෙයවන ලද්දේ නීතිඥ ගිල්මෝර් විසිනි. “තමන් යටතේ වූ ආරක්ෂක සේනා විසින් සිදුකරන ලද කෙලෙසීම් සම්බන්ධයෙන් රාජපක්ෂ මහතා ජාත්‍යන්තර නීතිය අනුව විධාන වගකීමෙන් බැඳෙයි.”

ITJP විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා: “රෝයි ගේ වධබන්ධන සිද්ධිය ශ්‍රී ලංකාවේ ආයතනගත සහ අප්‍රමාණ දණ්ඩ මුක්තිය සම්බන්ධයෙන් කියැවෙන ITJP විසින් ලේඛන ගත කොට ඇති සිය ගණනක් අතරින් එකකි. මේ ගෝඨාභය රාජපක්ෂට එරෙහිව විදේශයක පවරන ලද මුල්ම සිවිල් නඩු සේ සැලකේ. වෙනත් අයද පෙරට පැමිණ අප හා සම්බන්ධ වනු ඇතැයි යන්න අපේ විශ්වාසයයි. ඔවුන්ට සාමුහික ක්‍රියාකාරිත්වයකට එක් වී සහන සලසා ගත හැකිය.”

“විවෘතව පෙරට පැමිණි පළමුවැන්නන් අතරට එක්වීමෙන් රෝයි පෑ නිර්භීත කම අපේ ගෞරවයට පාත්‍රවන අතර, අපේ විශේෂඥ දැනුම සහ සම්පත් ශ්‍රී ලංකාවේ යුක්තිය සඳහා වන අරගලයේ ශුභසිද්ධියට යොදවන්නට හැකි වීම ගැන අපි සතුටු වෙමු,” යි හවුස්ෆෙල්ඩ් සභාපති මයිකල් හවුස්ෆෙල්ඩ් පැවසීය. “තවත් වින්දිතයන් ඉදිරිපත් වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.”

**වැඩිදුර මාධ්‍ය විමසීම් සඳහා අමතන්න:**
සොෆී ටොමසිස් +44(0)7974 428858 හෝ ෆ්‍රාන්සස් හැරිසන් +44 (0)7946 488089.

## සංස්කාරකවරුන්ගේ දැනගැනීම පිණිස

### ස්කොට් ගිල්මෝර් පිළිබඳව

ස්කොට් ගිල්මෝර් වොෂින්ටන් ඩීසී මූලස්ථාන කොටගත් ජාත්‍යන්තර මානව හිමිකම් නීතිඥයෙකි. ISIS ප්‍රාණ ඇපයේ සිටි ජේම්ස් ෆෝලි ගේ පවුලේ සාමාජිකයන් සහ බේබි ඩොක් ඩුවලියර් ගේ හයිටි වින්දිතයන් ඇතුළු ලොව පුරා වධහිංසාවෙන් හා යුද අපරාධ වලින් පීඩාවට පත් වූවන් නියෝජනය කර ඇත්තෙකි. *සන්ඩේ ටයිම්ස්* මාධ්‍යවේදිනී මාරි කොල්වින් මරාදැමීම සම්බන්ධයෙන් සිරියාවේ අසාද් පාලනයට එරෙහිව පැවරූ නඩුවකින් 2019 ජනවාරියේ ඇමරිකානු ඩොලර් මිලියන 303.6 ක් දිනා දීමට ඔහු සමත් විය.

### හවුස්ෆෙල්ඩ් පිළිබඳව

හවුස්ෆෙල්ඩ් යනු බර්ලින්, බොස්ටන්, බ්‍රසල්ස්, ඩසල්ඩෝෆ්, ලන්ඩන්, ස්ටොක්හෝම්, නිව්යෝර්ක්, පැරිස්, ෆිලඩෙල්ෆියා, සැන් ෆ්‍රැන්සිස්කෝ සහ වොෂිංටන් ඩීසී හි කාර්යාල සහිත ප්‍රධාන පෙළේ ජාත්‍යන්තර නීති සමාගමකි. එය සංකීර්ණ නඩුකර සම්බන්ධ විශේෂඥ දැනුමක් ඇති ආයතනයකි. එහිදී, ප්‍රතිහාර/තරගකාරිත්වය, මුල්‍ය සේවා, ක්‍රීඩා සහ විනෝද කර්මාන්ත, පාරිසරික, සමූහ අලාභ, පාරිභෝගික ආරක්ෂාව සහ බොහෝ දුරට ජාත්‍යන්තර පරිමාණයේ මානව හිමිකම් කරුණු ආදිය විශේෂිතය. ප්‍රතිහාර/තරගකාරිත්ව නීතිය පුද්ගලිකව බලාත්මක කිරීම සම්බන්ධයෙන් Legal 500 සහ Chambers & Partners විසින් එක්සත් ජනපදයේ සහ යුරෝපයේ ඉහළම තලයේ ශ්‍රේණිගත කර ඇති එකම සමාගම හවුස්ෆෙල්ඩ් වෙයි.

**ITJP පිළිබඳව**

සත්‍යය හා යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතිය (ITJP) දකුණු අප්‍රිකානු සංක්‍රාන්ති යුක්ති විශේෂඥ යැස්මින් සූකා විසින් මෙහෙයවනු ලබන රාජ්‍ය නොවන සංවිධානයකි. ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේ අවසාන අදියර සහ පශ්චාත් යුද කාල පරිච්ඡේදය ට අදළ සාක්ෂිවාචක සහ තොරතුරු ඇතුලත් විශාලතම ලේඛනාගාරය ඇත්තේ ඔවුන් සතුවය. යුද්ධයේ සහ වධහිංසා පැමිණවීමේ භූමිකාව සම්බන්ධයෙන් චෝදනා එල්ලවන ශ්‍රී ලංකාවේ විශ්‍රාමික හමුදපති වරයකු විලී, බ්‍රසීලය, පෙරු සහ කොලොම්බියාවේ තානාපති වරයකු ලෙස කටයුතු කරද්දී ITJP විසින් ඔහුට විරුද්ධව 2017 අගෝස්තුවේදී  සර්වලෝක අධිකරණ බලය යටතේ නඩු 4 ක් පවරන ලදී.